# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1891/38 - 2014 දෙසැම්බර් මස 05 වැනි සිකුරාදා - 2014.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

ජාතික ක්‍රීඩා සංගම් නියෝග මාලාවේ 54(3) වගන්තිය යටතේ විධානය

ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වගන්තිය යටතේ 2013 අගෝස්තු මස 30 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදුව අංක 1825/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 54(3) වගන්තිය යටතේ සඳහන් වන ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ රෙගුලාසි ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව,

ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන මාහරගේ දුග්ගන්නාරාලලාගේ රංජනී ජයකොඩි මහත්මියට ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයේ නව නිලධාරී මණ්ඩලය තෝරා ගැනීමේ නිලවරණය කැඳවීම හා පැවැත්වීමට මෙයින් නියම කරමි.

මහින්දානන්ද අලුත්ගමගේ,
ක්‍රීඩා අමාත්‍ය.

2014 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

12-668

1A - G 20709— 15 (2014/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*